# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2110/42 – 2019 පෙබරවාරි 14 වැනි බ්‍රහස්පතින්දා – 2019.02.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මැද පත්තුව සුළු කොට්ඨාසයේ, අංක 33, තල්ගමුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තල්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේජ්/ඒආර්එන්/2017/325 හා 2017.12.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් සහ ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ගම්මලේ වත්ත, එගොඩකපුවෙල්ලේහේන, ගුරුබෑවිල සහ අඹගැටේහේන – ප්‍රමාණය: හෙක්. 3.3986**

උතුරට: ගම්මලේවත්ත, ගුරුබෑවිල, අඹගැටේහේන සහ කුඩා ඔය; නැගෙනහිරට: කුඩා ඔය, ගුරුබෑවිල සහ වල්කොටුව; දකුණට: අරකොටවැල්ල ගම සහ අඹදෙනිය ගම; බටහිරට: කැබලි අක්ෂර බී, මළ ඇල සහ ගම්මලේවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0216**

උතුරට: කැබලි අක්ෂර සී, ගම්මලේවත්ත සහ මළ ඇල; නැගෙනහිරට: ගම්මලේවත්ත සහ කැබලි අක්ෂර ඒ; දකුණට: කැබලි අක්ෂර ඒ සහ අඹදෙනිය ගම; බටහිරට: අඹදෙනිය ගම සහ කැබලි අක්ෂර සී.

03. **කැබලි අක්ෂර 'සී' – ගම්මලේ වත්ත, එගොඩකපුවෙල්ලේහේන, ගුරුබෑවිල සහ අඹගැටේහේන – ප්‍රමාණය: හෙක්. 0.0665**

උතුරට: ගම්මලේවත්ත සහ මළ ඇල; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: කැබලි අක්ෂර බී සහ අඹදෙනිය ගම; බටහිරට: ගම්මලේවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/වීර්/317.
2018 ඔක්තෝබර් මස 25 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 – 136